## 255 ලෝකෙට දෙන්න මෙදා

ලෝකෙට දෙන්න මෙදා – සාමේ දානෙ බෙදා //

සමිඳේ තැනැ තැනැ ලෝකෙ පුරා – සමාදානෙ සෙත ඔබෙ පතුරා
යන්නට මා ඔබෙ අතේ දරා – ගනු මැන අවියක් ලෙස තෝරා

කොතැනද ඇත්තේ බේවෛරේ – වපුරම් එහි මම් සදාදරේ
පැරුණු හිත් ඇතියන් අතරේ – පතුරම් කමාවෙ හිත සොඳුරේ

අනුන්ව සතසතු පිණිසැ මගක් – සොයනට මා ගැනැ නොසිත වගක්
ගුරු දෙවිඳේ මට දෙන්නැ ඇසක් – දක්නට අනුන්ගෙ දුක් දහසක්

හැම අය හට දෙන ලෙසට බෙදා – අපටද ලැබේය එදින් එදා
එපා ඉන්න මේ ලෝකෙ බදා – ලබනට නම් ජීවිතේ සදා